# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 14,559 — 1965 නොවැම්බර් 17 වැනි බදාදා — 1965.11.17**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# II වැනි කොටස — අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් ශාඛාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

## ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන

### ප්‍රකාශනයයි

ශ්‍රී ලංකාද්වීපයේ ගරු ශ්‍රේෂ්ඨාධිකරණයෙන් මට ලැබී තිබෙන අධිකරණ විධානයක බලය පිට මැදරට චාරිකාවේ කුරුණෑගල මහේස්ත්‍රාත් තැනගේ කොට්ඨාශය සඳහා එකී අධිකරණයේ අපරාධ නඩු වාරයක් වර්ෂ 1965 ක්වූ දෙසැම්බර් මස පළමු වන දින පෙරවරු එකොළහට මහනුවර අධිකරණ ශාලාවේ දී පවත්වන්නට යෙදෙන බව මම මෙයින් ප්‍රකාශ කර සිටිමි.

තව ද, ඉහත කී වේලාවට එකී ස්ථානයට පැමිණ සිටින ලෙසත්, අවසර ඉල්ලා ලබාගෙන මිස එතැනින් පිටව නොයන ලෙසත්, මෙම නඩු වාරය හා සම්බන්ධකමක් ඇති සියලු දෙනාටම මම මෙයින් නියමකොට දනුම් දෙමි.

එච්. ඇස්. වනසිංහ,
වයඹ පලාතේ පිස්කාල්.

වර්ෂ 1965ක්වූ නොවැම්බර් මස 15 වන දින
කුරුණෑගල පිස්කල් කන්තෝරුවේදිය.

11–868

---

### ප්‍රකාශනයයි

ශ්‍රී ලංකාද්වීපයේ ගරු ශ්‍රේෂ්ඨාධිකරණයෙන් මට ලැබී තිබෙන අධිකරණ විධානයක බලය පිට මධ්‍යම කොට්ඨාශය දිස්ත්‍රික්කය සඳහා එකී අධිකරණයේ අපරාධ නඩු වාරයක් වර්ෂ 1965 ක්වූ දෙසැම්බර් මස 1 වන දින පෙරවරු 11 ට මහනුවර අධිකරණ ශාලාවේ දී පවත්වන්නට යෙදෙන බව මම මෙයින් ප්‍රකාශ කර සිටිමි.

තව ද, ඉහත කී වේලාවට එකී ස්ථානයට පැමිණ සිටින ලෙසත්, අවසර ඉල්ලා ලබාගෙන මිස එතැනින් පිටව නොයන ලෙසත්, මෙම නඩු වාරය හා සම්බන්ධකමක් ඇති සියලු දෙනාටම මම මෙයින් නියමකොට දනුම් දෙමි.

ඇඩ්මන් මහින්ද විජේනායක,
පිස්කල්, මධ්‍යම පලාත.

වර්ෂ 1965 ක්වූ නොවැම්බර් මස 15 වන දින
මහනුවර පිස්කල් කන්තෝරුවේදිය.

11–911


ලංකාවේ වැලව්වේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවෙන ලද කඩදාසිවල ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි.

141—ආර් 10387—1,795 (65/11)